# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2493/27 – 2026 ජුනි මස 17 වැනි බදාදා – 2026.06.17**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: CI/1909

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 03, ආර්. ඒ. ද මැල් මාවතේ අංක 20 යන ස්ථානයේ පිහිටා ඇති රෝයල් සෙරමික්ස් ලංකා පීඑල්සී හි හොරණ කර්මාන්ත ශාලාව සහ අනෙක් පාර්ශ්වය වශයෙන් දෙහිවල, නගර සභා පටුමගේ අංක 10 ස්ථානයේ පිහිටා ඇති අන්තර් සමාගම් සේවක සංගමය අතර 2026 ජනවාරි මස 12 වන දින ඇති කර ගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 මැයි මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහ ලේකම් කාර්යාලය,
කොළඹ 05.

**2026 අංක 10 දරන සාමූහික ගිවිසුම**

## සාමූහික ගිවිසුම

මෙම සාමූහික ගිවිසුම සමාගම් ආඥාපනතේ නිසි පරිදි ලියාපදිංචි වී ඇති, සිය ලියාපදිංචි කාර්යාලය, කොළඹ 03. ආර්. ඒ. ද මැල් මාවතේ අංක 20 යන ස්ථානයේ පිහිටා ඇති, රෝයල් සෙරමික්ස් ලංකා පීඑල්සී හොරණ කර්මාන්තශාලාව (මෙහි මින්පසු “සේවායෝජක” වශයෙන් හඳුන්වනු ලබන) එක් පාර්ශ්වයක් හැටියටද, වෘත්තීය සමිති ආඥාපනත යටතේ නිසි පරිදි ලියාපදිංචි වී ඇති, සිය ලියාපදිංචි කාර්යාලය අංක 10, නගර සභා පටුමග, දෙහිවල යන ස්ථානයේ පිහිටා ඇති අන්තර් සමාගම් සේවක සමිතිය (මෙහි මින් පසු “වෘත්තිය සමිතිය” වශයෙන් හඳුන්වනු ලබන) අනෙක් පාර්ශ්වය හැටියටද, කාර්මික ආරාවුල් පනතට අනුව දෙදහස් විසිහය වසරේ ජනවාරි මස 12 වන දින සකසා අත්සන් තබන ලද අතර, පාර්ශවයන් අතර පහත සඳහන් පරිදි එකඟ වේ.

**නාමය** : මෙම සාමූහික ගිවිසුම රෝයල් සෙරමික්ස් ලංකා පිඑල්සී - හොරණ කර්මාන්ත ශාලාවෙහි අත් කාර්මිකයින්ගේ සාමූහික ගිවිසුම 2025 ලෙස හැඳින්විය යුතු අතර මෙම ගිවිසුම සඳහා එම නාමය භාවිතා කළ යුතුය.

**ලියාපදිංචි කිරීම :** මෙම සාමූහික ගිවිසුම ලියාපදිංචි කිරීම සඳහා කාර්මික ආරාවුල් පනතට අනුකූලව කම්කරු කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් මගින් ඉල්ලීමක් කරනු ලබනවා ඇත.

**1. ආවරණය වන හා බැඳී සිටින සේවායෝජක**

රෝයල් සෙරමික්ස් ලංකා පිඑල්සි - හොරණ කර්මාන්ත ශාලාව

**2. ආවරණය වන හා බැඳී සිටින සේවකයින්**

මෙම ගිවිසුමෙන්, වෘත්තීය සමිතිය සහ මෙම ගිවිසුම අත්සන් කරනු ලබන දිනය වන විට ස්ථිර පත්වීම් ලැබූ අත් කාර්මිකයින් ලෙස (කර්මාන්තශාලා සේවකයන්) සේවයේ යොදවා ගනු ලැබ සිටින වෘත්තීය සමිතියේ සාමාජිකයින් ආවරණය වන අතර ඔවුහු මෙම ගිවිසුම මගින් බැඳී සිටී.

**3. ක්‍රියාත්මක වන දිනය හා කාලසීමාව**

මෙම ගිවිසුම 2025 දෙසැම්බර් මස 01 වන දින සිට බල පැවැත්විය යුතු වන අතර, දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වයට මාස තුනක (3) ලිඛිත දැනුම් දීමක් කර මෙම ගිවිසුම අවසන් කරනු ලැබුවහොත් මිස අඛණ්ඩව බලාත්මක වන්නේය. එසේ වුවද දෙපාර්ශ්වයෙන් කවර පාර්ශ්වයක් වුව ද 2028 නොවැම්බර් 30 දිනට පූර්වයෙන් එවැනි දැනුම දීමක් නොකළ යුතු අතර එවැනි දැනුම් දීමක් 2028 නොවැම්බර් 30 දින තෙක් බලාත්මක නොවී ගිවිසුම අවසන් නොවුසෙ පවතී. යම් පාර්ශ්වයක් විසින් 2028 නොවැම්බර් 30 දිනට පූර්වයෙන් මෙම ගිවිසුම අවසන් කරන මෙන් කරනු ලබන දැනුම්දීමක් කුමන ආකාරයෙකින් හෝ බලාත්මක නොවේ.

**4. වැටුප්**

සේවායෝජක විසින් මෙම ගිවිසුමෙන් ආවරණය වන හා බැඳී සිටින සියලුම සේවකයින්ගේ වැටුප්, පහත දක්වා ඇති පරිදි වැඩි කරනු ලැබිය යුතුය.

i. 2025 දෙසැම්බර් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි රු. 9,500/=
ii. 2026 දෙසැම්බර් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි රු. 4,500/=
iii. 2027 දෙසැම්බර් මස 1 වන දින සිට බල පැවැත්වෙන පරිදි රු. 3,500/= කින්

වන අතර මෙම වැඩිවීම 2025 දෙසැම්බර් මස 1 වන දින සිට 2028 නොවැම්බර් මස 30 වන දින දක්වා වන කාලය සඳහා වේ.

**5. වාර්ෂික වැටුප් වර්ධක**

වාර්ෂික වැටුප් වර්ධක ඒ ඒ සේවකයාගේ පුද්ගල කාර්ය සාධනය මත පදනම් වේ. යම් සේවකයෙකු තම කාර්ය සාධනය හොඳින් හෝ කළමනාකාරිත්වය බලාපොරොත්තු වන මට්ටමෙන් ඉටු නොකරයි නම්, ඔහුට/ ඇයට මෙම වාර්ෂික වැටුප් වර්ධකය ලබා දෙනු නොලැබේ. මෙය ලබා දීම කළමනාකාරිත්වයේ පූර්ණ අභිමතය පරිදි වේ. කාර්ය - සාධනය පදනම්ව දෙනු ලබන වාර්ෂික වැටුප් වර්ධකයන්හි අවම සහ උපරිම මට්ටම් පිළිවෙලින් රු. 1300/-හා රු. 1600/- වේ. වැටුප් රහිතව සේවයට වාර්තා නොකර සිටි දිනයන් වෙතොත් එකී සේවකයින්ට වාර්ෂික වැටුප් වර්ධක ලබා දෙනු නොලැබේ.

**6. වාර්ෂික ප්‍රසාද දීමනා**

දැනට වාර්ෂික ප්‍රසාද දීමනා ගණනය කිරීමේදී භාවිතා කරන ක්‍රමය, එනම් සියට 7.4 ක ප්‍රමාණය, තව දුරටත් ඒ පරිද්දෙන්ම පවත්වා ගෙන යැමට වෘත්තීය සමිතිය හා වෘත්තීය සමිති ශාඛාව එකඟ වේ.

**7. නිෂ්පාදන දිරිදීමනා**

කළමනාකාරිත්වය විසින් නියම කරනු ලබන ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා සේවකයන්ගේ උපරිම දායකත්වය ලබා ගැනීමට ශාඛා සමිතිය සහතික වන්නේය, යන එකඟත්වයට යටත්ව, දැනට ගණනය කරනු ලබන ක්‍රමයට පාදිතව අවම නිෂ්පාදන දිරි දීමනාව (මාසික) වන රු. 4,750/- වූ අගය වේ.

ධාරිතාව පුළුල් කිරීම සහ/ හෝ තාක්ෂණික දියුණු කිරීම් හේතුකොට ගෙන ඉහත ගණනය කිරීමේ ක්‍රම වේදය ප්‍රතිශෝධනය කිරීමේ අයිතිය සමාගම රඳවා ගනී.

**8. නිෂ්පාදන දිරි දීමනාව සඳහා නිදහස් වන වෛද්‍ය නිවාඩු**

නිෂ්පාදන දිරි දීමනාව ලබා දීමේදී මෙතෙක් පදනම් කර ගන්නා ලද නිවාඩු ක්‍රමවේදය නොවෙනස්ව පවතින අතර, මීට පෙර වෛද්‍ය නිවාඩු දින 01ක් නිෂ්පාදන දිරි දීමනාව සඳහා බල නොපාන ලද අතර, එය වෛද්‍ය නිවාඩු දින 02ක් දක්වා නිෂ්පාදන දිරි දීමනාවෙන් නිදහස් වේ. වෛද්‍ය සහතිකයේ නිරවද්‍ය භාවය තීරණය කිරීම ආයතනය සතුය.

**9. ව්‍යවස්ථාපිත නිවාඩු - ගෙවීම් සඳහා වන විශේෂ අතිරේක ගෙවීම**

සිංහල සහ දෙමළ අළුත් අවුරුද්ද නිමිත්තෙන් සමාගම විසින් ලබා දෙනුයේ පඩිපාලක සභා ආඥා පනත යටතේ වන තීරණයන් පරිදි නියම කොට ඇති නිවාඩු පමණි. ඊට අමතරව, යම් නිවාඩුවක් ලබා දෙන්නේ නම්, එය කළමනාකාරිත්වයේ පූර්ණ අභිමතය පරිදි පමණක් වේ. කළමනාකාරිත්වයේ අභිමතය පරිදි, සිංහල සහ දෙමළ අළුත් අවුරුද්ද සඳහා සේවකයින්ට නිවාඩු ලබා දෙන අතර. එය සේවකයාට හිමි වාර්ෂික නිවාඩු වලින් ආවරණය කරනු ලැබේ.

ව්‍යවස්ථාපිත නිවාඩු දිනයන්හි කරනු ලබන විශේෂ අතිරේක සානුකම්පිත ගෙවීම රු. 1,100/- කි. මෙය ගෙවනු ලබන්නේ ව්‍යවස්ථාපිත නිවාඩු දිනයන්හි පැමිණීම වර්ධනය කිරීමේ අරමුණිනි.

මීට අමතරව දිනක ගෙවීමක් සිදුවන අතර මුල් පැය අටට පැයකට 1 1/2 ක අතිරේක ගෙවීමක් ද කරනු ලැබේ.

**10. පෝය දින අතිරේක ගෙවීම්**

i. පෝය දින සඳහා වන නව අතිරේක ගෙවීම රු. 2,500/- කි. මීට අමතරව දිනක වැටුපද ගෙවනු ලැබේ.
ii. වෙසක් සහ පොසොන් පෝය දිනයන්ද, සාමාන්‍ය පෝය දිනයන් ලෙස සැළකේ.

**11. රාත්‍රී සේවා මුර දීමනාව**

රාත්‍රී සේවා මුර දීමනාව රු. 300/- කි. රාත්‍රී සේවා මුර දීමනාව ගෙවනු ලබන්නේ අදාළ පැමිණීමේ ප්‍රතිශතය අත්පත් කරගතහොත් පමණක් වන අතර, ඊට හිමිකම ලබා ගැනීම සඳහා වන ඉලක්ක ගත පැමිණීමේ ප්‍රතිශතය වනුයේ 60% කි.

**12.** ආයතනයේ සේවක සුභසාධනය උදෙසා සේවක නවාතැන් සඳහා සහයෝගයක් ලෙස ආයතනය විසින් රු.225,000/- ක මුදලක් මාසිකව වෙන් කරනු ලබන අතර වසර මුල වෘත්තීය සමිතිය විසින් නවාතැන්වල සිට සේවයට වාර්තා කරන්නා වූ සේවක නාම ලේඛනයක් මානව සම්පත් අංශයට ලබා දෙන අතර ආයතනය විසින් වෙන් කරන්නා වූ මුදල එම සේවකයන් අතර බෙදී යයි.

**13.** තවද, මෙම සාමූහික ගිවිසුම බලපවත්වන කාලය තුළදී, මෙම ගිවිසුමෙන් ආවරණය නොවන කරුණක් සම්බන්ධව යම් කාර්මික ආරාවුලක් පැන නැගුන හොත්, එය පහත දක්වා ඇති ආරාවුල් නිරවුල් කිරීමේ පටිපාටියට අනුකූලව සමථයට පත් කර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු බවට වෘත්තිය සමිතිය සහ සේවකයන් (ශාඛා වෘත්තීය සමිතිය) සේවායෝජක සමග එකඟ වේ.

i. ආරාවුලක් ඇති වූ පළමු අවස්ථාවේදී එයට විසඳුමක් ලබා ගැනීම සඳහා කළමනාකාරිත්වය සහ සේවකයන් (ශාඛා වෘත්තිය සමිතිය) මෙ පිළිබඳව (කර්මාන්තශාලා මට්ටමින්) සෘජුවම සාකච්ඡා කිරීම මගින් විසඳුමක් ලබා ගැනීමට උත්සාහ කළ යුතුය.

ii. එහිදී සමථයට පත් වීමක් සිදු නොවන්නේ නම්, වෘත්තිය සමිතිය (මව් සමිතියේ) ද සහභාගිත්වය ඇතිව, මේ පිළිබඳ ලංකා සේව්‍යයන්ගේ සම්මේලනයේදී සාකච්ඡා කළ යුතුය.

iii. එසේ සාකච්ඡා කිරීමෙන් අනතුරුවද විසඳුමක් නොවුනි නම්, එය නිරවුල් කර සමථයට පත් කිරිම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.


iv. එම ආරාවුල විසඳා ගැනීම සඳහා පාර්ශ්වයන් ගන්නා ලද සියලු ප්‍රයත්නයන් අසාර්ථක වුවහොත් එය කාර්මික ආරාවුල් පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව ස්වේච්ඡා බේරුම්කරණය සඳහා විශ්‍රාම ගිය දිස්ත්‍රික් හෝ අභියාචනාධිකරණ විනිසුරුවරයෙකු වෙත කම්කරු කොමසාරිස්වරයාගේ තීරණය පරිදි යොමු කළ යුතුය. බේරුම්කරුගේ තීරණය අවසාන තීරණය වන අතර පාර්ශ්වයන් දෙකම එයින් බැඳී සිටී.

**14.** සමාගමේ තරඟකාරි ශක්තිය වර්ධනය කිරීම සඳහා වෘත්තිය සමිතිය, ශාඛා වෘත්තිය සමිතිය සහ එහි සාමාජිකයන්, විනය පවත්වාගෙන යෑමට, නාස්තිය වැළැක්වීමට, ආරක්ෂා සහිත වැඩ කිරීමේ තත්වය පවත්වාගෙන යාමට, තත්ත්වය ඉහල නංවාලීමට, ඵලදායිතාවය වර්ධනය කිරීමට සහ කාර්යක්ෂමතාවය අත්කර ගැනීමට, තම සහයෝගය සමාගමට ලබා දිය යුතු අතර ඒ සම්බන්ධ විශේෂ ව්‍යාපෘති කටයුතු වලදී දෙපාර්ශ්වය විසින් සාකච්ඡා කොට එකඟතාවයට පැමිණ ක්‍රියාත්මක කිරීමට එකඟ වේ.

**15.** මෙම සාමූහික ගිවිසුමේ සඳහන් ප්‍රකාශිත කරුණු වලට යටත්ව, රැකියා නියුක්තියේ දැනට පවත්නා සියලුම නියමයන් හා කොන්දේසි එපරිද්දෙන්ම සේවකයන්ට ලබාදීමට සේවායෝජක කටයුතු කරනු ලබනවා ඇත.

එමෙන්ම මින් පෙර සාමූහික ගිවිසුම් වලට අදාල වන්නා වූ නියමයන් හා කොන්දේසි ද එපරිද්දෙන්ම බලපැවැත්වෙනු ඇත.

මෙයට සාක්ෂි දරනු වස් දෙදහස් විසිහය වසරේ ජනවාරි මස 12 වන දින පාර්ශ්වයන් විසින් අත්සන් තබන ලදී.


රෝයල් සෙරමික්ස් ලංකා පීඑල්සී - හොරණ කර්මාන්තශාලාව සඳහා සහ වෙනුවෙන්

අන්තර් සමාගම් සේවක සමිතිය සඳහා සහ වෙනුවෙන්

(නම) (නම)

තනතුර :- තනතුර :-

සාක්ෂි

1. (නම) 1. (නම)

තනතුර තනතුර

අත්සන අත්සන

2. (නම) 2. (නම)

තනතුර තනතුර

අත්සන අත්සන

EOG 06 - 0074

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.